**සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2025**

**------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සී/ස මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්රෝ එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මෙම කරුණු හේතුවෙන්, වාර්තා කළ හෝ වාර්තා නොකළ මුදල් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් අවශ්‍යවී ඇත්දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූර්ව වර්ෂ සඳහා වූ ගැලපුම් ලෙස අයහාර සංචිතයෙන් රු. 241,410 ක් අඩුකර, රු.මිලියන 1.68 ක් එකතු කර තිබුණද, කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අංක 10.21 ඡේදය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණ අතර ඉහත ප්‍රමිතියේ 10.23 ඡේදය ප්‍රකාර ඊට අදාළ හෙළිදරව් කිරීමද සිදුකර නොතිබුණි. | 2026 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව පූර්ව වර්ෂ වැරදි සංසන්දනාත්මකව ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත්, එම ගැලපුම් හෙළිදරව් කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 17.4 ඡේදය ප්‍රකාරව ගිරාදුරුකෝට්ටේ ගොවිපොළෙහි අක්කර 1054 ක ඉඩමෙහි වටිනාකම සහ දම්මින්න ගොවිපළෙහි අක්කර 100 ක ඉඩමෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිරාදුරුකෝට්ටේ ගොවිපලේ අක්කර 1054 හා දම්මින්න ගොවිපලේ අක්කර 100 ක භූමි ප්‍රමාණය සමාගමේ පරිහරණය සඳහා පමණක් ලබා දී ඇති අතර සමාගමට අයිතිය පවරා දීමක් සිදුවී නොමැති බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළයුතුය. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති 23.10 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් ආදායම හඳුනා ගැනීමේදී ගැනුම්කරුට භාණ්ඩ හා බැදි අවදානම හා ප්‍රතිලාභ මාරු කර තිබිය යුතුව තිබුණද, 2025 වර්ෂයේ විකුණා රු. මිලියන 2.44 ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ තේක්ක ගස් 40 ක් විගණිත දින වූ 2026 මාර්තු 09 වනවිටත් ඉවත් කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලැබී නොතිබුණි. එම හේතුවෙන් ආදායම රු.මිලියන 2.44 කින් වැඩිපුර දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව සිදු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ගැනුම්කරුට භාණ්ඩ හා බැදි අවධානම සහ ප්‍රතිලාභ හුවමාරු වූ පසු පමණක් විකුණුම් ආදායම ලෙස හඳුනා ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති 28.18 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික ගණනයේදී ආයුගණක අගය කිරීම් ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම් ගණනය කර ඊට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කළයුතු වූවද, සමාගම ඊට අනුකූලවී නොතිබුණි. | සමාගමේ සේවක සංඛ්‍යාව ඉතා අඩු සංඛ්‍යාවක් බැවින් පාරිතෝෂික ගණනයේදී ආයුගණන අගය කිරීමේ ක්‍රමය අනුගමනය කිරීමට විශේෂඥ සහාය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට හැකියාවක් නොමැති බැවින් ඉදිරියේදී මේ ක්‍රමය අනුගමනය කිරීමට සටහන් කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණන අගය කිරීමේ ක්‍රමය පදනම් කරගෙන පාරිතෝෂික වගකීම් ගණනය කර ගිණුම්ගත කළයුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පාරිතෝෂික ගෙවීම් රු. 322,420 ක්, තේක්ක ගස් අගය කිරීමේ හා තේක්ක ගස් විකිණීමේදී ලද එකතුව රු.මිලියන 10 ක් වූ ලාභය මූල්‍යමය නොවන ගනුදෙනුවක් ලෙස ලාභයට ගැලපීම හා තේක්ක ගස් විකිණීමෙන් ලද රු.මිලියන 3.15 ක් ආයෝජන කටයුතු යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම සිදුකර නොතිබුණි. තවද තොග වෙනස්වීම රු.මිලියන 1.24 ක් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගලපා නොතිබූ අතර, වෙළෙඳ හා ගෙවිය යුතු ශේෂයේ වෙනස රු.මිලියන 6.55 ක මුදල් ගලා යාම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.මිලියන 5.61 ක මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. | කරුණු නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | කාරක ප්‍රාග්ධන වෙනස්වීම් හා ආයෝජන කටයුතු නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතුය. |
| (ආ) | සමාගම සතුව පැවතුණු තඹුත්තේගම පිහිටි නිරාවිය ගොවිපොළ, කන්තලේ ගොවිපොළ, පොළොන්නරුවේ පිහිටි සිද්ධපුර ගොවිපොළ හා වැලිකන්දේ පිහිටි මුතුවැල්ල ගොවිපොළ වර්ෂ 2005-2010 අතර කාලපරිච්ඡේදය තුළ විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවකින් තොරව මහවැලි අධිකාරිය වෙත පවරා දී තිබුණි. එම ගොවිපොළවල් සතු පිරිවැය රු.මිලියන 22.34 ක් වූ ස්ථාවර වත්කම් සමාගම විසින් භාවිතා නොකරන නමුත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු අතර එම වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් හෝ භෞතිකව සමීක්ෂණයක් කර නොතිබුණි. එම හේතුවෙන් එම වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය. | මේ පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර 2026 වර්ෂයේදී ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | මහවැලි අධිකාරිය වෙත ලබා දුන් ගොවිපොළවල් සඳහා ලිඛිත ලේඛන හුවමාරු කර ගත යුතු අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම කළ යුතුය. එසේම මෙම වත්කම් භෞතිකව සමීක්ෂණය කර පැවැත්ම තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් වර්ෂයේ ආදායම් වියදම් නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් අදාල නිවැරදි කිරීම් පූර්ව වර්ෂ මූල්‍ය ප්‍රතිඵලයට ගැලපීම් සිදු කිරීම සමාගම විසින් දිගින් දිගටම සිදුකර තිබීම හේතුවෙන් 2022, 2023 හා 2024 වර්ෂවල විගණිත මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය ප්‍රතිඵලය වූ පිළිවෙලින් රු.167,815 ක ලාභය රු.295,352 ක අලාභය හා රු.මිලියන 9.77 ක ලාභය 2022, 2023 හා 2024 වර්ෂවලදී පිළිවෙලින් රු. 627,268 ක ලාභයක්, රු.මිලියන 6.34 ක අලාභයක් හා රු.මිලියන 11.21 ක ලාභයක් ලෙස සියයට 15 සිට සියයට 2048 ක ප්‍රතිශතයකින් වෙනස්වී තිබුණි. | ඉදිරියේදී අදාළ වර්ෂයේ වියදම් එම වර්ෂයේදීම ගැලපීමට සටහන් කර ඇති බව. | වර්ෂයට අදාළ ආදායම් වියදම් නිවැරදිව හඳුනා ගැනීම සඳහා වගකීම් සහිත පාලන පද්ධතියක් ස්ථාපිත කළයුතුය. |
| (ඈ) | වර්ෂ 05 ඉක්මවූ රු.මිලියන 13.32 ක ලැබිය යුතු ශේෂවල අයකර ගැනීම් අවිනිශ්චිත වුවද ඒ සඳහා හානිකරන අලාභ වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | 2026 වර්ෂයේ සිට අඩමාන ණය වෙන්කිරීම් සිදු කිරීමට සටහන් කර ගතිමි. වසර 05 ඉක්මවූ ගෙවිය යුතු ශේෂය 2026 වර්ෂයේදී කොටස් වශයෙන් ගෙවීමට සටහන් කර ඇති බව. | අයවීම් අවිනිශ්චිත ශේෂ සඳහා ප්‍රමාණවත් හානිකරණ අලාභ වෙන් කිරීමක් සිදු කළයුතුය. |
| (ඉ) | 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.29 ක වටිනාකමක් සහිත වාහන ජංගම නොවන වත්කම් ශේෂයෙන් හා ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර අපහරණ ගිණුමක දක්වා තිබුණි. | 2026 වර්ෂයේදී අපහරණය කිරීමට සටහන් කර ඇති බව. | අපහරණය කිරීමට හඳුනා ගන්නා ලද වත්කම් අපහරණය කර ඉවත් කරන තෙක් ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතුය. |
| (ඊ) | ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගම ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 ඔක්තෝබර් 03 අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාදී තිබුණු අතර, 2022 ජනවාරි 25 දිනද රාජ්‍ය පෞද්ගලික කළමනාකරණයකට ගිවිසුම්ගතවී සමාගම ප්‍රතිසංවිධානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද 2026 මාර්තු 09 දින තෙක් එම ප්‍රතිසංවිධාන කටයුතු සිදු කර නොතිබුණි. එසේම 2023, 2024 හා 2025 වර්ෂවල සමාගමේ ජංගම අනුපාත පිළිවෙලින් 0.32:1, 0.33:1 හා 0.4:1 ක් පමණක් වූයෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේ වුවද ඒ සම්බන්ධයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ගිණුම්කරණ ආයතන සඳහා වූ ප්‍රමිති අංක 3.9 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මෙම කාර්යය ඉටු කරනු ලබන බව. | ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළයුතු අතර සමාගමේ ජංගම අනුපාත 2:1 ලෙස පවත්වා ගැනීමට කටයුතු කළයුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල<br>රු.මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | පොදු සංචිතය | | | | |
| (i) | මහවැලි ආර්ථික ඒජන්සිය | 388.58 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | මෙම ප්‍රකාශිත ප්‍රාග්ධනය හා සංචිත ලෙස දක්වා ඇති ශේෂයන් තහවුරු කිරීමට ලේඛන නොමැත. මේ පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ශේෂ සනාථ කර ගැනීමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ii) | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2.9 | -එම- | | |
| (iii) | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3.58 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කිරීමට අදාල ලියකියවිලි | | |
| (iv) | විදේශ ආධාර | 5.73 | -එම- | | |
| (ආ) | ප්‍රාග්ධන සංචිත | 14.16 | -එම- | | |

### 1.6 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම 2018 වර්ෂයේ සිට විගණන ගාස්තු ගෙවා නොතිබුණු අතර, 2025 දෙසැම්බර් 31 දිනට විගණන ගාස්තු ලෙස රු.මිලියන1.28 ක් ගෙවිය යුතුව පැවතුණි. තවද, වර්ෂ 05 ඉක්මවූ ගෙවිය යුතු ශේෂ වටිනාකම රු.මිලියන 26.05 ක් වූ අතර, එය නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී ගෙවීමට කටයුතු කරනු ලබන බව. | කඩිනමින් හිඟ විගණන ගාස්තු ගෙවා නිම කිරීමටත්, වර්ෂ පහ ඉක්මවා ඇති ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළයුතුය. |
| (ආ) | දීර්ඝ කාලයක සිට ගෙවිය යුතු වැටුප් ලෙස රු.මිලියන 3.08 ක වැටුප් වැඩිවීමක්ද, ඊට අදාළ සේවක අර්ථසාධක අරමුදල් රු.මිලියන 1.15 ක් හා සේවක භාරකාර අරමුදල් රු. 166,208 ක් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී ගෙවීමට කටයුතු කරනු ලබන බව. | ගෙවිය යුතු වැටුප්, සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ලෙස දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂ නිරවුල් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත 10 (2) වගන්තිය | 2013 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා කාලසීමාව තුළ මාස 101 කට අදාළව සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු රු.මිලියන 18.95 ක දායක මුදලක් හා රු.මිලියන12.25 ක අධිභාරය විගණිත දිනය වූ 2026 මාර්තු 18 වන විටත් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නැත. | හිඟ දායක මුදල් කඩිනමින් ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගතයුතුය. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II කොටසේ 5 (1) වගන්තිය. | 2020 පෙබරවාරි මස සේවයෙන් ඉවත්වූ සේවකයන් තිදෙනෙකු වෙත ගෙවිය යුතු රු.මිලියන 1.32 ක පාරිතෝෂික මුදල 2025 දෙසැම්බර් 31 දින තෙක් ගෙවා නොතිබුණි. | ගෙවිය යුතු පාරිතෝෂික 2026 වර්ෂයේදී ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු පාරිතෝෂික මුදල් කඩිනමින් ගෙවා නිම කළයුතුය. |
| (ඇ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ II වන භාණ්ඩයේ 102 වගන්තිය. | සමාගම ආදායම් බදු සඳහා ලියාපදිංචි නොතිබුණි. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ඇති බව. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කළයුතුය. |
| (ඈ) 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) මෙහෙයුම් අත්පොතේ 3.2 ඡේදය | සියළුම රාජ්‍ය ව්‍යාපාර කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන්, රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යැවිය යුතු වුවත් සමාගම ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට සටහන් ඇති බව. | බඳවා ගැනීම් පටිපාටිය හා ගෙවීම් ව්‍යුහය සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ii) රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ | ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම උපාය මාර්ගික සැලසුම, ක්‍රියාකාරී සැලසුම හා වාර්ෂික | 2026 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ඇති බව. | ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතු අතර, උපාය |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහයේ 2.3 ඡේදය | අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට ඉදිරිපත් කළයුතු වුවද, සමාගම එසේ කටයුතු කර නොතිබුණි. | | මාර්ගික සැලසුම් ක්‍රියාකාරී සැලසුම හා වාර්ෂික අයවැය ලේඛනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම කළයුතුය. |
| (ඊ) | 2013 සැප්තැම්බර් 11 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.5 ඡේදය | රු.මිලියන 13.89 ක ගෙවිය යුතු පාරිතෝෂික මුදලක් හඳුනාගෙන තිබුණද එම මුදල වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පාරිතෝෂික මුදල වෙනම ගිණුමක තැන්පත් කිරීමට ඇති හැකියාව පිළිබඳව 2026 වර්ෂයේදී කටයුතු කිරීමට සටහන් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කළයුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.850,395 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 9.77 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 10.62 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ජෛව වත්කම් තොගයේ සාධාරණ අගය අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රුපියල් 10 කොටස් 5,000,000 කින් සමන්විතවී තිබූ නමුත්, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර 2023 වර්ෂයේ අධිකාරිය නමට එම කොටස් පවරා දී තිබුණි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයද මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර නොතිබුණු අතර, වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යක්ෂවරුන් පත් කර තිබුණි. එසේම 2015 වර්ෂයේ සිට මේ දක්වාම සමාගමට සභාපතිවරයෙක් පත්කර නොතිබුණි. | 2026 වර්ෂයේදී අනෙකුත් කොටස් නිකුත් කිරීමේ හැකියාව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | විධිමත් ලෙස සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉතිරි කොටස් නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී භාවිතයට ගත නොහැකි බවට හඳුනාගෙන තිබුණු රු.මිලියන 9.9 ක් වූ ස්ථාවර වත්කම් අපහරණය සඳහා 2025 දෙසැම්බර් 31 වන විටද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණ අතර සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් පිරිවැය රු.මිලියන 8.16 ක් වූ වාහන 04 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරන බව. | අභාවිත වත්කම් අපහරණය කිරීමටත්, සමාගම භාවිතා කරන මහවැලි අධිකාරියට අයත් වාහන පවරා ගැනීමටත් කඩිනමින් කටයුතු කළයුතුය. |
| (ඇ) | කිරි නිෂ්පාදනයේදී අතුරුඵලයක් ලෙස නිපදවෙන මේදය, අයිස්ක්‍රීම් හා එළඟිතෙල් නිෂ්පාදනයේ ප්‍රධාන අමු ද්‍රව්‍යයක් ලෙස භාවිතා කර තිබූ අතර, අයිස්ක්‍රීම් හා එළඟි තෙල් නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී යොදා ගන්නා එම මේදයෙහි වටිනාකම ගණනය කිරීමේදී ඒකක මිල රු.400 ක් ව පැවති සම්මත මිල 2024 පෙබරවාරි සිට රු. 1,000 ක් ලෙස වැඩිකර තිබුණි. ඒ සඳහා පදනම් කරගත් කරුණු, අනුමැතිය හා එය වැඩි කිරීම හේතුවෙන් වන බලපෑම විගණනයේදී අනාවරණය කර ගත නොහැකි විය. | 2026 වර්ෂයේ මෙම ගැලපීම් පිළිබඳව අවසාන ගිණුම් වල හෙළිදරව් කිරීමට සටහන් කර ඇති බව. | මේදයෙහි වටිනාකම ගණනය කිරීම පිළිබඳ තොරතුරු නිසි පරිදි හෙළිදරව් කළයුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාර්ෂිකව අයිස්ක්‍රීම් ලීටර 3000 ක් පමණ නිෂ්පාදනය කරන යන්ත්‍රය ක්‍රියා විරහිත වීම මත 2023 දෙසැම්බර් මස සිට නිෂ්පාදන කටයුතු නතර කර තිබුණු අතර, විගණිත දින වන 2026 මාර්තු 09 වනවිටත් එම යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේදී අයිස්ක්‍රීම් යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට හෝ එය අපහරණය කලයුතු නම් විධිමත් ලෙස අපහරණය කර නව යන්ත්‍රයක් මිලදී ගැනීමට හෝ කටයුතු කර අයිස්ක්‍රීම් නිෂ්පාදනය වැඩි කර ගත යුතුය. |
| (ආ) | 2025 වර්ෂයේදී මී ගවයන් 14 දෙනෙකු මියයාම් වාර්තාවී තිබුණු | 2026 වර්ෂයේ සිට වාර්තා කිරීමට කටයුතු කරන බව. | ජීවී සතුන් මිය යෑම පිළිබඳ අවස්ථානුකූලව |

| | | |
|---|---|---|
| අතර, ඒ සඳහා ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ නිර්දේශ හා අවස්ථානුකූල රූපරාමු සහිතව වාර්තාව හානි වාර්තා කමිටුව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි. | | ප්‍රදේශයේ පශු වෛද්‍යවරයාව දැනුවත් කර අදාළ වාර්තා ලබා ගැනීමට කටයුතු කළයුතුය. |

3.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිරාදුරුකෝට්ටේ ගොවිපලේ ලැබීම් බැංකුගත කිරීමක් සිදුනොකර රු.100,000 ඉක්මවා දෛනිකව මුදල් අත රඳවා ගන්නා අවස්ථා විය. 2025 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාසවල රු.මිලියන 2 ක ඉක්මවා මුදලක් එසේ රඳවා ගෙන තිබුණි. | 2026 වර්ෂයේ සිට බැංකුගත කිරීමට කටයුතු කරනු ලබන බව. | දෛනික ලැබීම් දිනපතා බැංකුගත කිරීමට කටයුතු කළ යුතු අතර එම වගකීම පැහැර හරින නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම අධීක්ෂණ කටයුතු සිදු කිරීමද නිලධාරීන්ගේ වගකීම විය යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිරාදුරුකෝට්ටේ ගොවිපොළ සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා රු.මිලියන 9.34 ක් වූ භාණ්ඩ 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරාදී තිබුණද මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් ඇති කර නොගැනීම හේතුවෙන්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. ගිරාඳුරුකෝට්ටේ සත්ත්ව ගොවිපොළට අයත් 1986 වර්ෂයේ ඉදිකර තිබුණු ගොඩනැගිලි 28 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පැවතුණි. | වෙනත් පාර්ශවයක අවශ්‍යතාවය මත ඉදි කරන ලද මෙම මධ්‍යස්ථානය 2016 වර්ෂයේ සමාගම වෙත පවරන ලද අතර මෙම වත්කම් භාවිතයට ගැනීමට ප්‍රාග්ධන හැකියාවක් සමාගම සතුව නොමැති බව. තවද ගොඩනැගිලි 28 ක් 2026 වර්ෂයේදී ලියාහැරීමට කටයුතු කරන බව. | මෙම වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| (ආ) | ගිරාදුරුකෝට්ටේ සහ දම්මින්න ඒකක සතුව අක්කර 1154 ක පමණ භූමියක් පැවතියත්, එම භූමිය සමාගම විසින් වගා කටයුතු සඳහා ඵලදායී ලෙස | කන්න බදු ක්‍රමය යටතේ ඉඩම් ඉල්ලා සිටි මුළු ගොවීන් ප්‍රමාණයටම ඉඩම් ලබා දෙන ලද බව. | සමාගම සතු භූමිය ඵලදායීව මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමටත්, ඉතිරිය බාහිර |

| | | |
|---|---|---|
| යොදා ගෙන නොතිබුණි. ඒ අනුව සමාගම සතු භූමියෙන් අක්කර 269 ක් හෙවත් සියයට 23 ක් පමණක් 2025 වර්ෂයේ බදුදී තිබුණි. | | පාර්ශවයන් වෙත කන්න බදු ක්‍රමයට ලබාදීමට අවශ්‍ය කටයුතු කළයුතුය. |

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **ඉලක්කගත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගමේ සාංසමික සංස්ථා පත්‍රයේ ගොවිපළවල වගා කටයුතු සිදුකිරිම, තොග හා සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරිම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම, අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන මූලික අරමුණු දක්වා තිබුණද, සුළු වශයෙන් සිදුකළ ඌරු පාලනය, බ්‍රොයිලර් නිෂ්පාදනය, එළු පාලනය යන ක්‍රියාකාරකම් 2020 වර්ෂයේ සිට වසරින් වසර නතර කරමින් සිට 2025 වර්ෂය වන විට මීගව පාලනය හැර අනිකුත් සියළුම කාර්යයන් නතර කර තිබුණි. එසේම සමාගම සතුව සිටි මී ගවයින්ගෙන්ද 26 දෙනෙකු 2025 වර්ෂය තුළ අලෙවි කර තිබූ අතර, වර්ෂය අවසානය වනවිට සමාගමේ ජීවී සතුන් ලෙස මී ගවයින් 118 ක් පමණක් ඉතිරිව සිටී. | ඉදිරි වර්ෂයේදී මෙම කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | සමාගම පිහිටවූ අරමුණු ඉටු කර ගැනීමට හෝ සමාගම සම්බන්ධයෙන් ලබා දී තිබූ අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි බාහිර ආයෝජකයෙකු සමඟ රාජ්‍ය පෞද්ගලික කළමණාකරණයකට ගිවිසුම්ගතවී සමාගම ප්‍රතිසංවිධානය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |